**ශීර්ෂය 007 අධිකරණ සේවා කොමිෂන් සභාව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 007 - අධිකරණ සේවා කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධිකරණ සේවා කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 31 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව සභාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 26 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අධිකරණ සේවා කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී.  මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී  දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.5 ඡේදය ප්‍රකාරව 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ශේෂය, අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂයේ සහ වසර අවසානයේ අග්‍රිම ශේෂයේ එකතුවට සමාන විය යුතු වුවත්, ඒසීඒ - 3 හි දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව රු.219,868 ක් වූ අග්‍රිම ශේෂය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දක්වා නොතිබූ අතර එය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මාර්ගස්ථ මුදල් ලෙස මූල්‍ය වත්කම් යටතේ ද, අග්‍රිම ශේෂය ලෙස ජංගම වගකීම් යටතේ ද දක්වා නොතිබුණි. | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ 2022 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය දක්වා නොමැත්තේ එදිනට ගිණුම් පොත්වල අග්‍රිම ශේෂයක් නොතිබූ බැවිනි. ඒ බව ACA – 3 අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශය මගින් පැහැදිලිව දක්වා ඇති බවද, ඒ අනුව අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය ACA – 7 අනුව රු. 6,312,856 ක් සහ අග්‍රිම ගිණුමේ ශේෂය ACA – 3 අනුව රු. 0 ක් බැවින් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ශේෂය ඒ දෙකෙහි එකතුව රු. 6,312,856 ක් ලෙස දක්වා ඇති බවත්, රු. 219,868 ක් වූ ඔබ විසින් අග්‍රිම ශේෂය ලෙස දක්වා ඇති එකී වටිනාකම 2022 දෙසැම්බර් 31 දින භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර ඇත. ඒ අනුව අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.5 ඡේදයට අනුකූලව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ශේෂය නිවැරදිව දක්වා ඇති බවත්, ආයතනික ගිණුම් පොත් අනුව (ACA -3) 2022.12.31 දිනට අග්‍රිම ශේෂයක් නොමැත. අග්‍රිම ශේෂයක් දක්වා ඇත්තේ භාණ්ඩාගාර ගිණුම් පොත් අනුව වේ. මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලබන්නේ දෙපාර්තමේන්තු ගිණුම් පොත් අනුව වන බැවින් ද, මෙය දැනටමත් භාණ්ඩාගාරය වෙත පියවා ඇති බැවින් ද, මාර්ගස්ථ මුදල් ලෙස ජංගම වත්කම් යටතේ හා අග්‍රිම ශේෂය ලෙස ජංගම වගකීම් යටතේ දක්වා නොමැති බව දන්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු අතර අග්‍රිම ශේෂය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ නිවැරදිව දැක්විය යුතු වේ. |

| | | |
|---|---|---|
| (ආ) රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 06 ඡේදය ප්‍රකාරව හඳුන්වා දී ඇති මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආකෘතිය අනුව වර්ෂය තුළ අපහරණය කරන ලද වාහන හා අනෙකුත් වත්කම් විකිණීමෙන් ලත් ආදායම වූ රු.3,603,750 ක් වූ වටිනාකම මුදල් ප්‍රවාහයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ හිමිකම් ඉවත් කිරීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම යටතේ දැක්විය යුතු වුව ද, එය මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා තිබුණි. | වර්ෂය තුළ අපහරණය කළ වාහන හා අනෙකුත් වත්කම් විකිණීමෙන් ලද ආදායම අතපසුවීමකින් එසේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා ඇති බව දන්වා තිබුණි. | වත්කම් විකිණීමෙන් ලද ආදායම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ නිවැරදිව දැක්විය යුතු වේ. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර 05 ට වැඩි කාලයක සිට පැවත එන සේවය හැර ගිය නිලධාරියෙකුගෙන් රු.185,000 ක ණයශේෂයක් අයකර ගැනීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV වෙනි පරිච්ඡේදයේ 4.5 හා 4.6 ඡේද ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | රු. 185,000 ක ණයශේෂය පවතින ණයකරුගේ වසර 10 කට වැඩි සේවා කාලයක් පැවති බැවින් ඇපකරුවන් රහිතව මෙම ණය නිකුත් කර ඇති අතර ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.6 හා රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2019 අනුව එම ශේෂය අයකර ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බව දන්වා තිබුණි. | ණයශේෂය අයකර ගැනීමට ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

#### (ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන ලේඛනය පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **ඇප ලේඛනය**<br>මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව සේවක කාණ්ඩ 09 කට අදාළ ඇප තැබිය යුතු නිලධාරීන් එම අවශ්‍යතාවය ඉටුකර නොතිබූ අතර අදාළ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මේ වන විට ඇප ලේඛනය සකස්කර ඇති බවත් නිරීක්ෂණය සඳහා මේ සමඟ ඉදිරිපත් කරන බවත් දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වාගත යුතු ය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 අප්‍රේල් 26 දිනැති 03/2022 අංක දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 03 (xvii) ඡේදය ප්‍රකාරව වර්ෂය තුළ වියදම් දැරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනවල ඉතිරිවීම් ඇත්නම් ඒවා වර්ෂය අවසන්වීමට පෙර වෙනත් වියදම් සඳහා යොදවා නොගත යුතු වුවත්, පුනරාවර්තන වැය විෂයයන් 02 ක රු.4,350,000 ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරුකර තිබුණි. | කාර්යාලයීය කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා දැරිය යුතු අත්‍යාවශ්‍යම වියදම් වෙනුවෙන් මෙසේ පුනරාවර්තන වැය විෂයයන්හි ඉතිරි ප්‍රතිපාදන, භාණ්ඩාගාරය ද දැනුවත්ව මාරු කරගෙන ඇති බව දන්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රතිපාදන උපයෝජනය කළ යුතු ය. |

### 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේ දී ගෙවන ලද 2022 වර්ෂයට අදාළ රු. 210,790 ක් වටිනා බැරකම්, බැරකම් ලේඛනයේ සහ 2022 දෙසැම්බර් 31 දිනට බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි. | 2022 වසර දෙසැම්බර් මස දුරකථන බිල්පත හා ආයතනික පිරිසිදු කිරීමේ සේවාවට අදාළ බිල්පත් ගෙවීම් සඳහා 2023 වසරේ අයවැය ඇස්තමේන්තු මගින් මුදල් වෙන්කර ගන්නා නිසා ඒවා සමාලෝචිත වසරේ බැඳීම් හා බැරකම් ලෙස වෙන්කොට දක්වා නොමැත. කෙසේ නමුත් එසේ ප්‍රවර්තන වසරට අදාළව එළඹෙන වසරේ ගෙවීම් බැරකම් ලේඛනයේ දැක්වීම අවශ්‍ය බවට ඔබ විසින් පෙන්වා දෙන්නේ නම් ඉදිරි වර්ෂයන්හි ඒ අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරන බව දන්වා තිබුණි. | නිවැරදිව බැරකම් වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළ දැක්විය යුතුය. |

### 2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන | කාර්යාලය තුළ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රමයක් ස්ථාපනය වෙනුවෙන් සෑම වසරක් පාසාම | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ |

| | | | |
|---|---|---|---|
| | යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | වර්ෂය ආරම්භයේදී ම ලිඛිතව, විගණන අංශයට ද පිටපතක් සහිතව බලය පැවරීම සිදු කරන අතර, වර්ෂය පුරා අඛණ්ඩව එහි සඵලදායීතාවය පිළිබඳ විමසිල්ලෙන් පසුවන බව කිව යුතුය. වෙනස්කමක් සිදු කිරීමට අවශ්‍ය වන අයුරින් අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලදායීතාවයෙහි ගැටළුවක් නොතිබූ බැවින්, නැවත එවැනි ලිඛිත සමාලෝචනයක් සිදු නොකරන ලද බව දන්වා තිබුණි. | විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ii) | වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදුවන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 3.1 (අ) ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණය හේතුවෙන් එම අවශ්‍යතා ඉටුකර නොතිබුණි. | මේ වන විට වාර්ෂික කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දන්වා තිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය 103 (1) (ඉ) | | 2021 දෙසැම්බර් 09 දින මෝටර් රථයක් හානියකට පත් වීම පිළිබඳව හානිපාඩු ලේඛනය තුළ ඇතුළත්කර නොතිබුණු අතර, 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරනු ලබන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයේ අයකර ගැනීම් සහ පොත්වලින් කපාහැරීම් පිළිබඳ ප්‍රකාශනයේ ද ඇතුළත් කර නොතිබුණි. | WP KX 6732 අංක දරන මෝටර් රථයට අදාළව තොරතුරු පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් නොකළ බව දන්වා තිබුණි. | වාහනවලට සිදුවන අනතුරු හානි පාඩු ලේඛනයේ හා මූල්‍ය ප්‍රකාශනවල පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ හා පොත්වලින් කපා හැරීම් පිළිබඳ ප්‍රකාශයේ ද සටහන් කළ යුතු වේ. |
| | 104 (1) (අ) | | මෝටර් රථයකට සිදු වූ හානිය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. | KX 6732 අංක දරන මෝටර් රථයට රාත්‍රී කාලයේදී සතෙක් සීරීම මත හානියක් සිදු වූ අතර ඒ සම්බන්ධයෙන් අදාළ රක්ෂණ සමාගමට දැනුම් දුන් බවද, රක්ෂණ සමාගම රථය පරීක්ෂා කිරීමෙන් අනතුරුව අදාළ මෝටර් රථයෙහි අලුත්වැඩියා කටයුතු කිරීම සඳහා සේවා සපයන ආයතනයට ඉදිරිපත් කරන ලද | වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | | බව දන්වා තිබුණි. මෝටර් රථයට අදාළ රක්ෂණ සමාගම විසින් රු.63,209 ක මුදලක් සේවා සැපයූ ආයතනයට ලබා දී තිබූ බවත්, රක්ෂණ සමාගම ප්‍රතිපූර්ණය කළ මුදලට අමතරව ගෙවීමට සිදුවූ රු.2,941 ක මුදල කොමිෂන් සභාව විසින් ගෙවන ලද බවත් දන්වා තිබුණි. | |
| | 1646 | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාහන 05 ක් සම්බන්ධයෙන් ධාවන සටහන් හා මාසික සාරාංශයේ මුල් පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මේ වනවිට වාහන ධාවන සටහන් මාසික සාරාංශයේ මුල් පිටපත් නියමිත දිනයන්හි දී විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති බව දන්වා තිබුණි. | වාහන සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ii) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| | 2008 පෙබරවාරි 06 දිනැති සහ 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008 සහ අංක 05/2008 (i) දරන චක්‍රලේඛය | චක්‍රලේඛ ප්‍රකාරව රාජ්‍ය අංශයේ ක්‍රියාකාරකම් වඩාත් කාර්යක්ෂම කිරීමට සහ ඒ සඳහා සම්බන්ධවන්නා වූ පාර්ශවයන් අතර මනා අවබෝධයක් සහ එකිනෙකා අතර විශ්වාසය වැඩි දියුණු කිරීමට පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වා දීම සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම සිදුකළ යුතුව තිබුණ ද, දෙපාර්තමේන්තුවේ මේ දක්වා පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වා දීම සිදුකර නොතිබුණි. | අංක 05/2008 සහ 05/2008 (i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දන්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| 2016 දෙසැම්බර් 31 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | චක්‍රලේඛය ප්‍රකාරව වාහන 05 ක් සම්බන්ධයෙන් ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | රටතුළ පැවති ඉන්ධන හිඟය හේතුවෙන් QR කේතය මගින් සතියකට ලීටර් 20 ක පමණ සීමිත ඉන්ධන ප්‍රමාණයක් එක් මෝටර් රථයක් සඳහා නිකුත් කළ බැවින් රා.ප.ච. 30/2016 චක්‍රලේඛය ප්‍රකාරව 2022 වර්ෂයේදී ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවන් සිදු කිරීමට නොහැකි වූ බව දන්වා තිබුණි. | ඉන්ධන දහනය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**2.5 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ හා සංශෝධිත මුදල් රෙගුලාසි 371 (2) ප්‍රකාරව කිසියම් විශේෂිත කාර්යයන් සඳහා මාණ්ඩලික නිලධාරීන්ට ලබාදෙන අතුරු අග්‍රිම දින 10 ක් ඇතුළත නැවත පියවිය යුතු වුවත්, එක් අවස්ථාවක දී ලබාදුන් රු.100,000 ක් වූ අත්තිකාරම් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අතුරු අග්‍රිමයන් අතරින් රට තුළ ඉන්ධන අර්බුදය සමඟ පැවති වාතාවරණය හා දීර්ඝ අලුත් අවුරුදු නිවාඩුව හමුවේ රු. 100,000 ක අතුරු අග්‍රිමය පියවීම සිදුකර ඇති අතර රු. 2,000 ක සහ රු.40,000 ක අනෙකුත් අතුරු අග්‍රිම දෙක කාර්යය නිමවූ වහාම මු.රෙ 371(2) අනුව පියවීම සිදුකොට ඇති බව දන්වා තිබුණි. | චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි ප්‍රකාරව තත්කාර්යය අතුරු අග්‍රිම කාල ප්‍රමාදයකින් තොරව පියවිය යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන චක්‍රලේඛයේ 12.1 ඡේදය සහ 2022 මැයි 26 දිනැති PFD/RED/REG/02/CC/2022 මුදල් අමාත්‍යාංශ ලිපිය ප්‍රකාරව 2021 වර්ෂයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට වාර්ෂික කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දන්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කාර්ය සාධන වාර්තාව නියමිත දිනට ඉදිරිපත් කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| (ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාර වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | සමස්ත අධිකරණ පද්ධතියටම අදාළ සහ අධිකරණයන්හි ස්වාධීනත්වය කෙරෙහි ඍජුවම බලපාන කරුණු අඩංගු වන බැවින් ගරු නීතිපතිතුමාගේ අංක AG/28/2016 හා 2016.09.27 දිනැති ලිපිය ප්‍රකාරව අපගේ කාර්යසාධන වාර්තා මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ නොහැකි බව දන්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කළ යුතු වේ. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අප්‍රේල් 27 දිනැති අංක එම්එස්ඩීඩබ්/08/65 දරන තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද ලිපිය ප්‍රකාරව තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම සඳහා අවශ්‍ය පරිදි කටයුතු කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධීකරණය කිරීමට නිලධාරීන් පත්කොට තිරසර සංවර්ධන වැඩසටහනක් පිළියෙල කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දන්වා තිබුණි. | තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය නිකුත් කරන ලද ලිපිය ප්‍රකාරව තිරසර සංවර්ධන වැඩසටහනක් පිළියෙල කළ යුතු වේ. |

## 5. යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අංක 40 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අධිකරණ සේවා කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමට ප්‍රමාණවත් ඉඩකඩ නොමැති වීම හේතුවෙන් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොමැති අතර අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැතිව වුව ද, කිසිදු මුදල්/ සම්පත් නාස්තියකින් තොරව ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා අදාළ චක්‍රලේඛ අනුව කටයුතු කරමින්, විචක්ෂණශීලීව රාජ්‍ය මූල්‍ය කළමනාකරණය කරමින් ආයතනය තුළ ඉතා ඉහළ මට්ටමේ මූල්‍ය විනයක් පවත්වාගෙන යනු ලබන බව දන්වා තිබුණි. | ජාතික විගණන පනතේ හා මුදල් රෙගුලාසි ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 6. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවෙහි අනුමත කාර්ය මණ්ඩලය 117 ක් වුව ද, දෙසැම්බර් 31 දින වන විට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 09 ක්, තෘතීයික මට්ටමේ තනතුරු 03 ක් ද, ද්විතීය මට්ටමේ තනතුරු 31 ක් සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 15 ක ඌණතාවයක් පැවතුණි. | අනුමත කාර්ය මණ්ඩලය 117 ක් වුව ද, නිලධාරීන් 63 දෙනෙකු වැනි අවම සංඛ්‍යාවකින් අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි සම්පූර්ණ අධිකරණ පද්ධතියේ ම අධීක්ෂණය, මෙහෙයවීම සහ පරිපාලනයට අදාළ සියලු කටයුතු මෙම ලේකම් කාර්යාලය මගින් නිසි පරිදි පවත්වාගෙන යනු ලැබේ.<br><br>අවම සේවක සංඛ්‍යාවක් රාජකාරී කළ ද නිසි කළමනාකරණය සහ පරිපාලනය හේතුවෙන් සියලු රාජකාරී කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යන අතර රජයේ මුදල් උපරිම කාර්යක්ෂමතාවයකින්, සඵලදායීව, විචක්ෂණශීලී මනා මූල්‍ය පාලනයකින් යුතුව භාවිතාකර ඇති බව ද අවසන් වශයෙන් පෙන්වා දෙන බව දන්වා තිබුණි. | කඩිනමින් පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | අංක 02/2018 හා 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 01 ඡේදය ප්‍රකාරව සමස්ත කාර්ය මණ්ඩලය සඳහා ම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම 2018 වර්ෂයේ සිට සිදුකළ යුතු වුවත්, මේ දක්වා ඒ අනුව කටයුතුකර නොතිබුණ අතර චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් කොමිෂන් සභාව විසින් පිළියෙල කර නොතිබුණි. | මේ වන විට අධිකරණ කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර, මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරමින් පවතින බව දන්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සැලැස්මක් සකස් කිරීම හා වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කළ යුතු වේ. |